ඉතිරි කරගත්තෙ කවුරු හරි පාවිච්චි කරපු වයලීනයක්වත් ගන්න. ජයසේකරගේ වයලීනය තරුණයා අතට පත්වෙන්නෙ අන්න එහෙම. තරුණයා ප්‍රවීන් රසදේවයන්ගෙන් වයලීන වාදනය ඉගෙනගන්න යොමුවෙන්නෙ ජයසේකර මිත්‍රයාගේ වචනෙට. ප්‍රවීන් රසදේවයන්ගේ වෙලෝ රිද්මයට අපේ තරුණයාගේ අලුත් වයලින් වාදන මුහුවෙන්නෙ අන්න එහෙම.

තාත්තා අකාලයේ ජීවතුන් අතරින් වෙන්වුණ නිසා මඟහැරුණ දේවල් බොහොමයි. අම්මා දුක් මහන්සියෙන් තමන්ගේ දරුවන් දෙන්නට දුක් නොදී හැදුව බව ඇත්ත. අනපේක්ෂිත දේවල් නිසා ජීවිතයේ ඕනෑ - එපාකම්, ප්‍රමුඛතා ලේඛණයේ මුල් අංකවලට විතරක් සීමා කරන්න වෙනවා.

"ව්‍යුත්පත්තිය, ව්‍යුත්පත්තිය" තාත්තාගේ හඬ සිහිවෙනවා. ව්‍යුත්පත්තිය කියන්නේ අධ්‍යාපනය නම්, ඉගෙනගන්නේ මොනවාටද කියන ගැටළුව මතුවෙනවා.

"ඉගෙනගන්නෙ හොඳින් ජීවත්වෙන්න..." අම්මා කිව්වා.

එහෙම නම් ඉගෙනගන්න ඕන මොනවද?

සංගීතය...?

ඒක තාත්තාත් ඉතිරි කරලා ගිය ප්‍රශ්ණයක්...! ඒ ප්‍රශ්ණයට පිළිතුර විදියට ලැබුණ දෙයින් රැකියාවක් නම් ලැබුණා ජීවත් වෙන්න.

නමුත්...? ජීවිතයේ හිදැසක්!

රැකියාව කරන ගමන්වත් සංගීතය ඉගෙනගත්තොත්...?

ගෙදරට ම දිරාපත් වුණ වයලීනය තරුණ හිතේ ඇති කළේ පශ්චාත්තාපයක්.

"මඟහැරුණා නේද, නුඹ මට?"

"ලේසියෙන් මඟහැරෙන්න දෙන්න එපා...!" පරණ වයලීනය තරුණ හිතට කිව්වා තරයේ ම.





"මං නැතිවත්..." පරණ වයලීනය දුඹුළු අතරින් හිනාවුණා.

"ප්‍රවීණ වයලින් වාද්‍ය විශාරද ප්‍රවීන් රසදේව."

ජයසේකර පංති මිත්‍රයාගෙන් රසදේවයන් ගැන දැනගන්න ලැබුණෙ එහෙම. රසදේවයන්ගේ අපූරු වාදන හැකියාව වගේ ම නිර්මාණ හැකියාවත් ඉහළයි. ඒ නිර්මාණත් හරිම නැවුම්. ගායන ශිල්පීන්ට තමන්ගේ ස්වතන්ත්‍ර තනු දායක කරන්නට රසදේවයන් පසුබට වුණේ නෑ. රසදේවයන්ගෙන් සංගීතය ඉගෙනගන්න වැඩිපුර ම ආවෙ රැකියාවල් කරන වැඩිහිටි අය කියලා කිව්වොත් වැරදි නෑ. ඒ අතරේ අපේ තරුණයා කැපිලා පෙනුණේ නිකම් ම නෙවි.

"නිසඟ කුසලතාව" තාත්තාගේ හඬ දෝංකාර දෙනවා. ප්‍රවීන් රසදේවයන් තමන්ගේ තරුණ ගෝලයාව අඳුනාගන්නවා හරියට ම.

"සතත අභ්‍යාසය, සතත අභ්‍යාසය" රසදේවයන්ගේ මුව'ගින් ගිලිහෙන්නේ ස්වර අභ්‍යාස ටිකවත් පුහුණු වෙලා එන්නෙ නැති වැඩිහිටි ගෝලයින් වෙනුවෙන්. ශාස්ත්‍රීය රාග, තානාලංකාරත් එක්ක අගේට පුහුණු වෙලා වාදනය කරන තරුණයාට තාත්තාගෙන් කුඩා කාලයේ අහන්න ලැබුණ වචන තවත් කෙනෙකුගෙන් අහන්න ඕන වුණේ නෑ.

විශාරද ප්‍රවීන් රසදේවයන් දේවත්වයෙන් අදහන ශාස්ත්‍රය වුණේ උත්තර භාරතීය රාගධාරී සංගීතය. සිත් නිවාලන රස භාව! සිත් කුළු ගන්වන තානාලංකාර!! සිත් පොපියවන රිද්ම රටා!!! මේ භාවාත්මක සංගීතයට තමන්ගේ ගෝලයින්ව කැන්දාගෙන යන්න රසදේවයන් දැක්වූයේ පුදුම හැකියාවක්. ඒ වගේම උනන්දුවක්.

ඒත්?

අපේ සින්දු?

හැත්තෑව අසූව දශකයේ නිර්මාණය වුණ සින්දු අදටත් හිතේ පිළිරැව් දෙනවා. ගුවන් විදුලියේ ප්‍රචාරය වෙනකොට ඒ